ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

<u>ශ්‍රී ලංකා නිලධාරීන් සඳහා රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ආකෘතීන් සහ රාමු පිළිබඳ ධාරිතා ගොඩනැගීමේ වැඩසටහනක්</u>

ශ්‍රී ලංකා රජයේ නිලධාරීන් 14 දෙනෙකුගෙන් සමන්විත දූත පිරිසක් 2026 පෙබරවාරි 23-27 දක්වා පැවැත්වෙන රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයන් පිළිබඳ විශේෂ පුහුණු සහ ධාරිතා ගොඩනැගීමේ වැඩසටහනකට සහභාගී වීම සඳහා ඉන්දීය සංචාරයක නිරත වූහ. ජනාධිපති ලේකම් කාර්යාලයේ සහ ප්‍රවාහන සහ මහාමාර්ග අමාත්‍යාංශය සහ බලශක්ති අමාත්‍යාංශය ඇතුළු ප්‍රධාන පෙළේ අමාත්‍යාංශ කිහිපයක නිලධාරීන් මෙම කණ්ඩායමට ඇතුළත් විය.

2. ඉන්දීය අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා විසින් සිය 2025 අප්‍රේල් ශ්‍රී ලංකා සංචාරය අතරතුර ශ්‍රී ලාංකික වෘත්තිකයන් සඳහා වාර්ෂිකව විශේෂයෙන් සකසන ලද පුහුණු අවස්ථා 700ක් පිරිනමන බව ප්‍රකාශ කළ අතර ඒ අනුව මෙම වැඩසටහන සංවිධානය කර තිබිණ.

3. ඉන්දීය රජය විසින් සංවිධානය කරන ලද මෙම පුහුණු වැඩසටහන මුදල් අමාත්‍යාංශයේ මූල්‍ය කළමනාකරණය පිළිබඳ අරුන් ජේට්ලි ජාතික ආයතනයේ දී සතියක් පුරා පැවැත්විණ. ඉන්දියාවේ රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ප්‍රතිපත්ති පද්ධතිය, ආයතනික රාමුව, අවදානම් පැවරීමේ යාන්ත්‍රණ, ව්‍යාපෘති ව්‍යුහගතකිරීම් සහ වරාය, නාවික කටයුතු, මෙට්‍රෝ දුම්රිය සහ ගුවන් තොටුපොළ යටිතල පහසුකම් ඇතුළු එක් එක් ක්ෂේත්‍රයන්ට අදාළ සිද්ධි අධ්‍යයනයන් ආවරණය කරමින් තාක්ෂණික සහ තේමාත්මක සැසි රැසක් වැඩසටහනට ඇතුළත් විය. අත්දැකීම් ඇසුරෙන් ඉගෙන ගැනීමට ද අවස්ථාව සලසා දී තිබූ අතර ඒ යටතේ සහභාගීවන්නන් සඳහා ජෙවාර් හි නොයිඩා ජාත්‍යන්තර ගුවන් තොටුපොළ වෙත ක්ෂේත්‍ර චාරිකාවක් සංවිධානය කර තිබිණ. මෙම ගුවන් තොටුපොළ රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ආකෘතිය යටතේ අලුතෙන්ම ඉදිකරන ලද ගුවන් තොටුපොළකි.

4. මෙම සංචාරය ධාරිතා ගොඩනැගීම සහ ජනතා කේන්ද්‍රීය ආර්ථික හවුල්කාරිත්වය සඳහා දෙරටෙහිම කැපවීම පිළිබිඹු කරමින් වෘත්තීමය හැකියාවන් ශක්තිමත් කිරීමට, දැනුම හුවමාරුව ප්‍රවර්ධනය කිරීමට සහ ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ක්ෂේත්‍රය තුළ ආයතනික සහ රජය-රජය අතර සබඳතා ගැඹුරු කිරීමට අර්ථාන්විත දායකත්වයක් ලබා දුන්නේය.

***

**කොළඹ**

***2026*** මාර්තු ***02***